අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref.: ED/04/60/01/වා.ස්.මා. (2025)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.:
දිනය / திகதி / Date: 2025.02. 28

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත
සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත

**2025 ජාතික පාසල්වල සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම**

1. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2025 යටතේ ජාතික පාසල්වල විදුහල්පතිවරුන්ගේ ස්ථාන මාරු සඳහා මාර්ගගත ක්‍රමවේදයට අනුව අයදුම්පත් කැඳවීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තීරණය කර ඇත. මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට අදාළව පහත උපදෙස් සංග්‍රහය පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

මෙම ස්ථාන මාරුවීම් ප්‍රධාන කාණ්ඩ 02කින් සමන්විත වේ.

1.1 **පළමු කාණ්ඩය : අනිවාර්ය විදුහල්පති ස්ථාන මාරු**

1.1.1 දැනට ස්ථිරව සේවය කරන ජාතික පාසලේ 2024.12.31 දිනට සේවා කාලය වසර 06 ක් සම්පූර්ණ කරන, වයස අවුරුදු 58 ට අඩු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලියට යටත් වේ.

1.1.2 සේවා කාලය ගණනය කිරීමේ දී පෞද්ගලික අවශ්‍යතා හේතුවෙන් ලබා ගත් තාවකාලික අනුයුක්ත වීම්, දේශීය/විදේශීය වැටුප් සහිත/රහිත නිවාඩු ආදිය ද වැටුප් ලබන පාසලේ සේවා කාලයට අයත් ලෙස සැලකිය යුතු ය.

1.1.3 අනිවාර්ය ස්ථාන මාරු සඳහා යටත් වුව ද කිසියම් විදුහල්පති සේවයේ නිලධාරියෙකු නියමිත දිනට මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්ථාන මාරු අයදුම් කර නොමැති නම්, විදුහල්පති විසින් PTB/2025/01 ආකෘති පත්‍රය සම්පූර්ණ කර තම නිර්දේශ සහිතව යොමු කළ යුතු ය. මෙම තොරතුරු මත පදනම්ව එම විදුහල්පතිවරුන් හට ස්ථාන මාරු ලබා දීම විදුහල්පති මාරු මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

1.2 **දෙවන කාණ්ඩය : වාර්ෂික ස්ථාන මාරු**

1.2.1 පළමු කාණ්ඩයට අයත් නොවන නමුත් තම අවශ්‍යතා මත ස්ථාන මාරු අපේක්ෂා කරන විදුහල්පතිවරුන්ටද අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය.

2. www.nspt.moe.gov.lk වෙබ් සබැඳිය ඔස්සේ මාර්ගගතව විදුහල්පති ස්ථාන මාරු අයදුම්පත සම්පූර්ණ කර, එහි මුද්‍රිත පිටපතක් තම පාසලේ ස්ථිර විදුහල්පති වෙත තමා විසින්ම භාර දිය යුතු ය.

2.1. මාර්ගගතව විදුහල්පති ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාල සීමාව 2025.03.01 දින සිට 2025.03.14 දින දක්වා වේ. ස්ථිර විදුහල්පති විසින් එහි මුද්‍රිත පිටපතෙහි තම අත්සන හා දිනය යොදා 2025.03.14 දින හෝ එදිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාරදිය යුතුය.

3. ස්ථිර විදුහල්පති වෙත මාර්ගගතව යොමු වී ඇති අයදුම්පත් සම්බන්ධයෙන් ඔබගේ නිර්දේශ www.nspt.moe.gov.lk දිගුව ඔස්සේ Login as a principal පිවිසුම හරහා මාර්ගගතව යොමු කළ යුතු ය. විදුහල්පති ස්ථාන මාරු අයදුම්පත් සඳහා මාර්ගගතව ස්ථිර විදුහල්පති විසින් නිර්දේශ ලබාදීමේ අවසන් දිනය 2025.03.14 වේ. මෙහිදී ස්ථිර විදුහල්පතිගේ නිර්දේශ සහිත අයදුම්පතෙහි සහ PTB/2025/01 ආකෘතියේ මුද්‍රිත පිටපත්වල තම අත්සන, දිනය හා නිල මුද්‍රාව තබා සහතික කර තිබිය යුතුය.

4. 2025.03.01 සිට 2025.03.14 දින දක්වා මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්ථාන මාරු අයදුම් කරන ලෙස විදුහල්පතිවරුන් දැනුවත් කිරීම, අන්තර්ජාල පරිගණක පහසුකම් ලබාදීම හා විදුහල්පතිවරයා විසින්ම තම වාර්ෂික ස්ථාන මාරු අයදුම්පතේ මුද්‍රිත පිටපත අත්සන් කර 2025.03.14 දින හෝ එදිනට පෙර හෝ ස්ථිර විදුහල්පති වෙත භාර දිය යුතු බවට විදුහල්පතිවරුන් දැනුවත් කිරීම ස්ථිර විදුහල්පතිගේ වගකීමකි.

5. එක් එක් විදුහල්පතිවරයාගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත සමඟ වෛද්‍ය කරුණු ඉදිරිපත් කිරීමට අත්‍යවශ්‍ය නම්, පිළිගත් වෛද්‍ය සහතික රජයේ රෝහලක හෝ ලියාපදිංචි පෞද්ගලික රෝහලක හෝ රෝගියාට ප්‍රතිකාර කරනු ලබන විශේෂඥ වෛද්‍යවරයා විසින් විධිමත්ව සහතික කළ යුතුය.

**6. ස්ථිර විදුහල්පති විසින් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාර දීම සම්බන්ධ උපදෙස්**

6.1 ඔබ පාසලට අයත් විදුහල්පති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කට්ටලය භාර දීමේ දී පහත උපලේඛන ද අනුපිළිවෙලින් අමුණන්න.

i. නිර්දේශ ලබා දී ඇති විදුහල්පති වාර්ෂික ස්ථාන මාරු අයදුම් කරන ලද අයදුම්පත්

ii.ස්ථාන මාරු අයදුම්පත් යොමු කරනු ලබන සියලුම විදුහල්පතිවරුන්ගේ තොරතුරු (www.nspt.moe.gov.lk සබැඳිය ඔස්සේ Login as a principal පිවිසුම මගින් පිවිස සියලු අයදුම්පත් සඳහා නිර්දේශ ලබාදිය යුතුය).
මේ සඳහා ජාතික පාසල් ගුරු ස්ථාන මාරු දත්ත පද්ධතිය වෙත ප්‍රවේශ වීම සඳහා දැනටමත් විදුහල්පතිවරුන් වෙත සපයා ඇති පරිශීලක නාම (User name) සහ මුරපද (Password) භාවිතා කළ යුතුය.

iii. PTB/2025/01 උපලේඛනය - තම පාසලේ සේවය කරනු ලබන 2024.12.31 දිනට වසර 06 ක් හෝ ඊට වැඩි හෝ සේවා කාලයක් සහිත වයස අවුරුදු 58 ට අඩු මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කර නොමැති විදුහල්පතිවරුන්ගේ නාම ලේඛනය
(මේ යටතේ විදුහල්පතිවරුන් නොමැති අවස්ථාවල දී ඒ බව සටහන් කළ යුතුය).

**7. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් විදුහල්පති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් අධ්‍යාපන අමාත්‍යාංශයේ විදුහල්පති ශාඛාවට භාර දීම සම්බන්ධ උපදෙස්**

7.1 ඔබ කලාපයට අයත් වාර්ෂික විදුහල්පති ස්ථාන මාරු අයදුම්පත් කට්ටලය භාර දීමේ දී පහත උපලේඛන ද අනුපිළිවෙලින් අමුණන්න.

i. ස්ථාන මාරු අයදුම්පත් යොමු කරනු ලබන සියලුම විදුහල්පතිවරුන්ගේ තොරතුරු (www.nspt.moe.gov.lk දිගුව ඔස්සේ Login as a Zonal Director පිවිසුම මගින් පිවිස සියලු අයදුම්පත් සඳහා නිර්දේශ ලබාදිය යුතුය.)
මේ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත Username හා Password යොමු කෙරෙනු ඇත. මුරපද (Password) ලබා ගැනීමට 0112-784827 (විදුහල්පති ශාඛාව) සම්බන්ධ කර ගන්න.

8. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලැබෙන මුද්‍රිත අයදුම්පත්‍ර කට්ටලය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන, දිනය හා නිල මුද්‍රාව තබා සහතික කොට PDF ගොනුවක් ලෙස පරිලෝකනය කර (Scan) ලබා දී ඇති අතුරු මුහුණත හරහා පද්ධතියට උඩුගත කිරීම (Upload) ප්‍රමාණවත් වේ. (අයදුම්පත රැගෙන අමාත්‍යාංශය වෙත පැමිණීම අත්‍යවශ්‍ය නොවේ.)

9. අදාළ උපදෙස්වලට පරිබාහිරව විදුහල්පතිවරුන් පුද්ගලිකව රැගෙන එන හෝ තැපැල මගින් යොමු කරන හෝ කිසිදු අයදුම්පතක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර ගනු නොලැබේ. පුද්ගලිකව යොමු කරන සියලු ලේඛන කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ සම්බන්ධව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

10. වැඩිදුර උපදෙස් හෝ යම් ගැටලුවක් පවතී නම් හෝ කාර්යාල වේලාව තුළ පහත දුරකථන අංකවලට අමතන්න.

| | |
|---|---|
| මාර්ගගත ක්‍රමය ඔස්සේ විදුහල්පති ස්ථාන මාරු අයදුම් කිරීමේ දී **තාක්ෂණික ගැටලුවක්** පවතී නම් දත්ත කළමනාකරණ ශාඛාව | 011-2806184 |
| විදුහල්පති ශාඛාව | 011-2784827 |

11. මෙම වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව වාර්ෂික ස්ථාන මාරු - 2025 මඟින් සම්පූර්ණ කිරීමට නොහැකි වූ ජාතික පාසල්වල පවතින ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පුරප්පාඩු සහ 2025 වර්ෂය තුළදී විශ්‍රාමයාම හේතුවෙන් පුරප්පාඩු වීමට නියමිත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පුරප්පාඩු සඳහා අයදුම් කිරීමට පළාත් සභා යටතේ පවතින පාසල්වල සේවයේ යෙදෙන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ට අවස්ථාවක් ලබා දෙනු ඇත.

12. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය - 2025 ක්‍රියාත්මක කිරීමෙන් පසු ඊට පෙර නිලධාරීන් විසින් විදුහල්පති ශාඛාව වෙත යොමුකර ඇති ස්ථාන මාරු අයදුම්පත් සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉදිරි කටයුතු සිදු නොකරන බව කාරුණිකව දන්වා සිටිමි.

නාලක කළුවැව
ලේකම්